# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2002 අංක 30 දරන මුදල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2002 දෙසැම්බර් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 දෙසැම්බර් මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 4.25 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

## 2002 අංක 30 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2002 දෙසැම්බර් මස 11 වන දින.]

එල්. ඩී.—ඕ. 41/2002

### 2002 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2002 අංක 30 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 2002 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටසේ (වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද පැනවීම) 2 වන වගන්තියේ, "බද්දක් පනවා අයකර ගනු ලැබිය යුතුය." යන වචන වෙනුවට "බද්දක් පනවා අයකර ගනු ලැබිය යුතු ය: 2002 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටසේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

එසේ වුවද, සකස් කොට නැවත අපනයනය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද භාණ්ඩයක් සම්බන්ධයෙන් වන විට, ඒ භාණ්ඩයේ පිරිවැය, රක්ෂණය සහ නැව්ගාස්තු වටිනාකම මත වූ බද්ද සියයට 0.75 ක අනුප්‍රමාණයකින් අයකර ගනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. මේ පනතේ 2 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2002 මැයි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. අතීතයට බලපෑම.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි: අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.